# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,813 - 2013 මැයි මස 31 වැනි සිකුරාදා - 2013.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1516 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1516 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- (i) සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූනි මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූනි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු – ඇබෑර්තු

**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව**

තනතුරු පුරප්පාඩු නිවේදනය සංශෝධනය කිරීම

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

අංක 1,807 දරන හා 2013 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසේ (පළාත් පාලනය) පළ කරන ලද දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ තනතුරු පුරප්පාඩු නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

පුරප්පාඩු තනතුරුවල ගිනිභට තනතුරට අදාල අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් යටතේ පහත සඳහන් වගන්තිය ඇතුළත් වේ :-

*(ඉ)* අයදුම්කරුවන් වයස අවුරුදු 18 -25 ත් අතර විය යුතු ය.
ඒ අනුව බඳවා ගැනීම් සඳහා පොදු කොන්දේසි යටතේ අංක III සහ VI පහත පරිදි සංශෝධනය වේ :-

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගිනිභට තනතුර සඳහා වන අයදුම්කරුවන් හැර අනෙකුත් අයදුම්කරුවන් වයස අවුරුදු 18-45 ත් අතර විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත. වූවන්ට මේ උපරිම වයස් සීමාව අදාල නොවේ.)

VI. සේවා අවශ්‍යතාවය අනුව සහ අදාල බඳවා ගැනීම් පරිපාටිය අනුව විධිමත් ලිඛිත පරීක්ෂණයකට, සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ඒ අනුව "අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය" යටතේ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2013.06.08 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

කේ. බී. වී. ඩී. එන්. මුතුගල,
නාගරික කොමසාරිස්,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2013 මැයි 10 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේදී ය.

05-800

---

# පළාත් පාලන නිවේදන

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම සඳහන් අය, එහි සඳහන් ස්ථානයේ 2013 වර්ෂය සඳහා ගව මස් වෙළඳාමක් කර ගෙන යාමට ඉල්ලුම් කර ඇත. ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටින යම් අයෙකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය, විරුද්ධ වන්නේ කුමන හේතුවක් සඳහා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් 02 කින් යුක්තව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 30 ක් ඇතුළත දී මා වෙත එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. අතුල නිලංග බණ්ඩාර හදගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ ලිපිනය* | *ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|
| පී. ක්‍රිස්ටෝපර් කිංස්ලි මහතා<br>අංක A 334 C,<br>කොලොන්ගොල්ල,<br>හේවාදිවෙල. | හේවාදිවෙල,<br>කොලොන්ගොල්ල. | ගව මස් වෙළඳාම |

05-924

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2012.12.26 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුල යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ආර්. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2012 දෙසැම්බර් මස 26 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *මාර්ග විස්තරය* | *දිග* | *පළල* |
|---|---|---|
| | අඩි 995.0 | අඩි 10.0 |
| | (මීටර් 303.0) | මීටර් 3.0) |

ග්‍රාම නිලධාරි වසම 2බී මැදගලදෙනිය
මාර්ගයේ නම මැදගලදෙනිය බතලවත්ත මාර්ගය

මැදගලදෙනියෙන් ආරම්භව වම්පසින් ඩබ්ලිව්. විමලසිරි යන අයට අයත් ඉහල කොටුව ඉඩම, ඩබ්ලිව්. ජයසේන යන අයට අයත් උඩකොටුව ඉඩම, එස් . වීරසිංහට අයත් වරපනයාගේවත්ත, ඊ. ඩබ්ලිව්. එස්. එදිරිසිංහ යන අයට අයත් මැදවත්ත යන ඉඩම්වලින් මායිම් වන්නාවූ ද ඃ

දකුණු පසින් ඊ. ගුනපාල යන අයට අයත් ගල්පොත්තහේන ඉඩම, ඩබ්ලිව්. එස්. ටී. කුමාර, ඒ. එස්. කේ. දිසානායක යන අයට අයත් උඩකනත්තේහේන, ජේ. රණසිංහට අයත් ඉහල කොටුව ඉඩම, එස්. එම්. හේමලතා, එස්. එස්. විජේසූරිය, ඊ. පී. කරුණාවතී, ඊ. ජයතිලක යන අයවලුන්ට අයත් ගල්පොත්තහේන ඉඩම ද, ඊ. සෙනෙවිරත්න යන අයට අයත් උඩකනත්තේහේන ඉඩම, ඊ. ඩබ්ලිව්. එස්. එදිරිසිංහ යන අයට අයත් මූනගහමුලවත්ත වත්ත යන ඉඩම්වලින් මායිම් වන්නා වූ මැදගලදෙනිය බතලවත්ත වත්ත මාර්ගය.

05-925/2

---

**කොළඹ මහ නගර සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයන්හි 2013 වර්ෂය තුළ මස් කඩ පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කොළඹ මහ නගර සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පලවී දින 14ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272) වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

අහමඩ් ජමල්ඩීන් මොහොමඩ් මුසම්මිල්,
නගරාධිපති,
කොළඹ මහ නගර සභාව.

2013 මැයි මස 15 වැනි දින.,
නගර ශාලාව,
කොළඹ 07.

උපලේඛන 01

| *අනු අංකය* | *ටෙන්ඩර්කරුගේ නම* | *කඩ අංකය* | *වෙළඳ ස්වභාවය* |
|---|---|---|---|
| *වැල්ලවත්ත පොදු වෙළඳපොල* | | | |
| 1. | එම්. අයි. එන්. ඛාන් මයා | 02 | එළුමස් |
| *ඩීන්ස් පාර පොදු වෙළඳපොල* | | | |
| 2. | එම්. රහුමාන් මයා | 44/14 | ගව මස් |
| *කොම්පඤ්ඤවීදිය වෙළඳපොල* | | | |
| 3. | එම්. එච්. බී. නිසාර් මිය | 02 | ගව මස් |

05-907

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24 (2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව මගින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙසට හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. කේ. සුමිත් වීරසිංහ,
සභාපති,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 14 වැනි දින,

***උපලේඛනය අංක 01***

*මාර්ගයේ නම* :- මඩහපොල සිට ගුරුස්ස පන්සල දක්වා මාර්ගය
*ආරම්භ වන ස්ථානය* :- මහ යාය පාරේ සිට
*අවසන් වන ස්ථානය* :- ගුරුස්ස පන්සල
*මාර්ගයේ දිග* :- අඩි 6160
*මාර්ගයේ පළල* :- අඩි 16 සහ 12 අතර
*මාර්ගය අයත්වන ග්‍රාම නිලධාරී වසම* :- 416 ගුරුස්ස

| *වම්පස පිහිටි ඉඩම් හිමියන්* | *දකුණු පස පිහිටි ඉඩම් හිමියන්* |
|---|---|
| එම්. ඩී. පද්මා විජේසූරිය | මෙන්ඩිස් |
| ගාමිණී ජයරත්න | ගාමිණී ජයරත්න |
| දයා කාන්ති | දයා කාන්ති |
| ඉසෙඩ් සිරිවරධන | ඉසෙඩ් සිරිවරධන |
| ඒ. එම්. හීංබණ්ඩා | ඒ. එම්. හීංබණ්ඩා |
| ඒ. එම්. පුංචිමැණිකා | ඒ. එම්. පුංචිමැණිකා |
| ආර්. එම්. ප්‍රේමතිලක | ආර්. එම්. ප්‍රේමතිලක |
| ඩී. එම්. මුතුබංඩා | ඩී. එම්. මුතුබංඩා |
| ඒ. එම්. මුතුමැණිකා | ඒ. එම්. මුතුමැණිකා |

05-886

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2012.12.26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පලල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව තම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කල ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුල යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2012 දෙසැම්බර් මස 26 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*මාර්ග විස්තරය*

| *දිග* | *පළල* |
|---|---|
| අඩි 375.0 (මීටර් 114.0) | අඩි 9.0 (මීටර් 2.75) |

| | |
|---|---|
| ග්‍රාම නිලධාරි වසම | අංක 05 දැලිවල |
| මාර්ගයේ නම | මිරිහාගොඩ පන්වත්තහේන පාර සිට එම්. ජී. පුංචිබණ්ඩාගේ ඉඩම දක්වා අතුරු මාර්ගය |

මිරිහාගොඩ පන්වත්තහේන පාරෙන් ආරම්භව වම් පසින් එස්. ඒ. රංජිත් ජයතිස්ස යන අයට අයත් කෝන්ගහමුල වත්ත ඉඩම, බී. එස්. ජී. සුමනරත්න යන අයට අයත් තොටිල්ලගහමුලවත්ත හෙවත් පරගහමුලවත්ත ඉඩම, එම්. ජී. කිරිබණ්ඩා යන අයට අයත් කෝන්ගහමුලවත්ත යන ඉඩම්වලින් මායිම් වන්නාවූ ද,

දකුණු පසින් එස්. ඒ. රංජිත් ජයතිස්ස, එස්. ඒ. පොඩිනිලමේ, යන අයට අයත් කෝන්ගහමුලවත්ත ඉඩමෙන් මායිම් වන්නා වූ මිරිහාගොඩ පන්වත්තහේන පාර සිට එම්. ජී. පුංචිබණ්ඩාගේ ඉඩම දක්වා අතුරු මාර්ගය.

05-925/1

---

**සම්මත අතුරු ව්‍යවස්ථා**

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

261 වැනි අධිකාරිය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් 2013.02.27 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 06 IV යටතේ පහත උපලේඛනයේ සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එල්. ආර්. රංජිත් විජේනායක,
සභාපති,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2013 පෙබරවාරි මස 27 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදනු ලැබ 2010.07.16 දිනැති හා අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පලකරන ලද වයඹ පළාත් සභාව විසින් 2011 ජනවාරි මස 18 වැනි දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරනු ලැබූ බව 2011.04.28 වැනි දිනැති අංක 1703/18 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පල කරන වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න අන්තරාදායක සහ අප්‍රසන්න අන්තරාදායක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා, සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා, ප්‍රාදේශීය සභා සීමාව වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

05-997

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.